# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 11,706—1959 මාර්තු 23 වැනි සඳුද—23.3.1959**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඩ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත්කිරීම්

**1959 අංක 117**

අ. ආ. කා. අංකය : C 218/56 (III)

පළාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති තැන්‍ාත් ගරු ජේ. කුරුප්පු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා දිවයිනට පෙරළා පැමිණෙන තුරු, 1946යේ හා 1947තේ ලංකා (ආණ්ඩුක්‍රම හා සවාධිනතා) රාජ ---- නියෝගවල 49 (3) වැනි වගන්තිය යටතේ, පළාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමාගේ පාර්ලිමේන්තු ලේකම්, ඇම්. බී. ඩබ්ලිව්. මැදිවෑ පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා, 1959 මාර්තු 22 වැනි දින සිට, පළාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති වශයෙන් වැඩ බැලීමට, අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් පත් කළ බව මෙයින් දන්වනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඇන්. ඩබ්ලිව්. අතුකෝරාළ,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1959 මාර්තු 22 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්යාලය.

---

## ආණ්ඩුවේ නිවේදන

අ.ආ.කා. අංකය. 0.377/52.

ලංකාවෙහි, පකිස්තානු මහ කොමසාරිස් ලෙස බලය පවරනු ලැබූ, හමීඩ හුසේන් උතුමාණන් වහන්සේගේ අක්තපත්‍රය මහා රාජිණිය වෙනුවෙන් අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ භාරගත්හ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඇන්. ඩබ්ලිව්. අතුකෝරාළ,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1959 මාර්තු 19 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්යාලය.

---

අ.ආ.කා. අංකය. 0. 342/50.

ලංකාවෙහි, නෝර්වේ අති විශේෂ නියෝජිත හා පූර්ණ බල ඇමති ලෙස බලය පවරනු ලැබූ, හැන්ස් ඔලෆ් උතුමාණන් වහන්සේගේ අක්තපත්‍රය මහා රාජිණිය වෙනුවෙන් අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ භාරගත්හ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඇන්. ඩබ්ලිව්. අතුකෝරාළ,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්,

1959 මාර්තු 19 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්යාලය.

857—ජේ. ඇන්. **ආර්** 962—5,050 (3/59)

# මිල පාලන දැන්වීම්

**ඇම්. ඇන්. 3/1959 වැනි අංකය දරණ ආහාර මිළ නියෝගය** **සීනි.**

## 1950හේ අංක 29 දරණ මිල පාලන පනත

### නියෝගය

මන්නාරම් දිස්ත්‍රික්කයේ (ආහාර) සහකාර මිළ පාලක තැන්පත් සන්මුගම් පරමනාදන් වන මම, 1950 අංක 29 දරන මිළ පාලන පනතේ 4වැනි සහ 3 (2) යන කොටස් වලින් මා වෙත පැවරී තිබෙණ බලතල අනුව—

(1) 1956 මැයි 11 වැනි දින හා 10,928 වැනි අංකය දරණ ලංකා ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද මැයි 1 වැනි දිනය දරණ ආහාර මිළ නියෝගය අද දින සිට මෙයින් අවලංගු කරමි.

(2) තොග වෙළෙන්දෙකු තොග වශයෙන් විකිණීමේදී සීනි ශුද්ධ බර හොණ්ඩරයක්ද, සිල්ලර වෙළෙන්දෙකු සිල්ලර වශයෙන් පාරිභෝගික යෙකුට විකිණීමේදී සීනි ශුද්ධ බර රාත්තලක්ද, උප ලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ප්‍රදේශය තුළ විකිණිය හැකි වැඩිම මිළ අද දින සිට මේ උපලේඛනයේ 3 වැනි සහ 4 වැනි තීරයන්හි පිළිවෙලින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) තවද, මෙම නියෝගයේ කාය්‍ය්‍යය සඳහා—

(අ) සීනි ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ සීනි වරකට ශුද්ධ බර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් විකිණීම තොග වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත්,

(ආ) සීනි ඕනෑම ප්‍රමාණයක් පරිභෝගය හෝ පාවිච්චිය පිණිස හෝ ශුද්ධ බර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත්.

(ඇ) '' සීනි '' සියලු වර්ගයේම හකුරුත් ඇතුලත්ව.

(4) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලබන සෑම ප්‍රදේශයකම සීනි වෙනත් ද්‍රව්‍යයක් සමඟ මිශ්‍රකොට බාලකිරීමෙන් නොවිකිණිය යුතු බවත් නියම කරමි.

(5) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලබන සෑම ප්‍රදේශයකම සීනි යම් ස්ථානයක හෝ සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකු විසින්ම සීනි සඳහා නියම කරනු ලැබූ, වැඩිම මිළ සඳහන් දැන්වීමක් එම ස්ථානයේ ප්‍රකට පෙනෙන පරිදි තැබිය යුතුය.

(6) එසේම මෙම නියෝගයේ කාය්‍ය්‍යය සඳහා '' රාත්තල '' නොහොත් '' රා '' යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්ඩුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බව නියම කරමි.

(7) මේ මිළ නියෝගයේ වැඩිම මිළ නියම කරනු ලබන සෑම ප්‍රදේශයකම සීනි තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකුම හා සීනි සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු විසින්ම මිළයට ගන්නා ඉල්ලුවහොත්, පහත සඳහන් විස්තර, එනම්,

(අ) විකුණූ දිනය

(ආ) විකුණූ සීනි ප්‍රමාණය

(ඇ) විකුණූ සීනි සඳහා ගෙවූ මුදල

(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම්, තොග වශයෙන්ද, සිල්ලර වශයෙන්ද යන වග ඇතුළත් කුවිතාන්සියක් මිළදී ගන්නාට දියයුතු බවත් නියම කරමි.

(8) සීනි විකිණීමේදී යම්කිසි දෙයක ඔතනු ලැබේ නම් හෝ බහාලනු ලැබේ නම් එහි මිළත් එම උපලේඛනවල සඳහන් මිළ ගණන් වලට ඇතුලත් වන බවද නියම කරමි.

1959 මාර්තු මස 18 වැනි දින පස්වරු 4 ට මන්නාරම් කච්චේරියේදී අත්සන් කරන ලදී.

ඇස්. පරමනාදන්,
මන්නාරම් දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක තැන.

### උපලෙඛනය

| 1 වෙනි තීරය | 2 වෙනි තීරය | 3 වෙනි තීරය | 4 වෙනි තීරය |
|---|---|---|---|
| ප්‍රදේශය | විස්තර | තොග වෙළන්දෙකු විසින් දළබර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ රු. ශ. | සිල්ලර වෙළෙන්දෙකු ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ රු. ශ. |
| මන්නාරම් සුළු නගර සීමාව තුළ ... ... ... | දුඹුරු පාට සීනි ... | 61 50 ... | 0 58 |
| | ශුද්ධ කළ සුදු සීනි ... | 69 27 ... | 0 65 |
| ගම්කාය්‍ය්‍ය සභා සීමාව නානාඩ්ඩන් නැගෙනහිර (මුරුන්කන් කඩ වීදිය) ... | දුඹුරු පාට සීනි ... | 62 50 ... | 0 59 |
| | ශුද්ධ කළ සුදු සීනි ... | 70 28 ... | 0 66 |
| මන්නාරම් ආදයම් පාලක තුමාගේ කොට්ඨාශය, මන්නාරම් නගරය හැර ... | දුඹුරු පාට සීනි ... | — ... | 0 59 |
| | ශුද්ධ කළ සුදු සීනි ... | — ... | 0 66 |
| ඉහත සඳහන් ප්‍රදේශය හැර, මන්නාරම් දිස්ත්‍රික්කයේ අනෙක් සියලු ප්‍රදේශවල | දුඹුරු පාට සීනි ... | — ... | 0 60 |
| | ශුද්ධ කළ සුදු සීනි ... | — ... | 0 67 |

**සැලකිය යුතුයි.**—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතාම වැඩිම මිළ ගණන්ය. මේ ගණන් වලට ඉහලින් ඒ ද්‍රව්‍ය විකිණිය නොහැකිය.

---

**අ. 50 වැනි අංකය දරණ ආහාර මිළ නියෝගය.** **සීනි (දුඹුරු)**

## 1950හේ අංක 29 දරණ මිල පාලන පනත

### නියෝගය

අනුරාධපුර දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක තැන්පත් ජෝන් ක්ලැරන්ස් ලක්ෂමන් මෙල්ඩර් ගුණරත්න වන මම 1950 අංක 29 දරණ මිල පාලන පණතේ 3 (2) දරණ වගන්තිය සමග කිය විය යුතු 4 වැනි වගන්තියෙන් මට පැවරී තිබෙන බල තල අනුව.

1. 1956 මැයි 11 වෙනි දින හා 10,928 වැනි අංකය දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරණ ලද 1956 මැයි 7 වෙනි දින හා අ. 9 වැනි අංකය දරණ ආහාර මිළ නියෝගය අද දින සිට මෙයින් අවලංගු කරමි.

2. දුඹුරු සීනි තොග වශයෙන් විකිණීමේදී දළ බර හොණ්ඩරයක්ද, සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක්ද, මීට යා කර ඇති උප ලේඛණයේ 1 වැනි තීරයේ සඳහන් ප්‍රදේශයන් ඇතුළත විකිණිය හැකි වැඩිම මිළ මේ දැන් පටන් මේ උප ලේඛණයේ 2 වැනි හා 3 වැනි තීරවල අනුපිළිවෙලින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

3. තවද මෙම නියෝගයේ කාර්ය සඳහා—

(අ) සීනි ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ වරකට සීනි දළ බර හොණ්ඩරයකට වැඩි ප්‍රමාණය බැගින් කොයි අන්දමට විකිණීම හෝ තොග වශයෙන් විකිණීමක් ලෙස සළකනු ලබන බවත්,

(ආ) සීනි පරිභොගය, පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ දළ බර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සළකනු ලබන බවත්,

(ඇ) සීනි යන්නෙන් සියළුම හකුරු වර්ග අත්හැර සළකනු ලබන බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

4. එසේම මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, සීනි වෙන ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාල කොට කිසිවකු විසින් නො විකිණිය යුතු බවද නියම කරමි.

5. තවද මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ යම් වාහනයක් සීනි සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ හෝ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම එම ප්‍රදේශය සඳහා මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ ගණන් සටහන් කරණ ලද දැන්වීමක් එකී ස්ථානයේ හෝ වාහනයේ ප්‍රකටව පෙනෙන පරිදි තැබිය යුතු බව නියම කරමි.

6. තවද මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම සීනි තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු හා සීනි සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තකු විසින්ම මිළයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර එනම් :—

(අ) විකුණූ දිනය ;

(ආ) විකුණූ සීනි ප්‍රමාණය (බර අනුවයි) ;

(ඇ) විකුණූ සීනි ප්‍රමාණය සඳහා ගෙවූ මුදල සහ ;

(ඈ) වෙළඳාමේ ස්වභාවය එනම්, වෙළඳාම තොග වශයෙන්ද සිල්ලර වශයෙන්ද යන වග ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දිය යුතු බවද නියම කරමි.

7. එසේම මෙම නියෝගයේ කාර්ය සඳහා " රාත්තල " හෙවත් " රා. " යනුවෙන් සළකනු ලබන්නේ ඇවැර්දූපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

8. සීනි විකුණන විට එය යම් කිසි දෙයක බහා හෝ ඔතා දෙන දෙයක් වෙතොත් එහි මිළත් උප ලේඛනයේ 2 වැනි හා 3 වැනි තීරවල සඳහන් වැඩිම මිළ ගණන් වලට ඇතුළත් වන බවද නියම කරමි.

1959 මාර්තු මස 21 වෙනි දින පෙරවරු 11.30 ට අනුරාධපුරයේදී අත්සන් තබන ලදී.

ජේ. සී. ඇල්. ඇම්. ගුණරත්න,
අනුරාධපුරයේ දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක තැන.

## උපලේඛනය

| 1 වෙනි තීරය | (දුඹුරු) සීනි — 2 වෙනි තීරය | (දුඹුරු) සීනි — 3 වෙනි තීරය |
|---|---|---|
| ප්‍රදේශය | දළ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ | ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ |
| | රු. ශ. | රු. ශ. |
| 1. අනුරාධපුර නගර සහා සීමාවන් හා අංක 23 සී දරන කුලාන ... | 59 98 | 0 56 |
| 2. අනුරාධපුර නගර සහා සීමාවන් හැර නුවර ගම් කෝරලේ ... | 59 98 | 0 57 |
| 3. අංක 23 සී දරන කුලාන හැර කනදරා කෝරලේ ... | 59 98 | 0 57 |
| 4. එප්පාවල කෝරලේ ... ... ... | 59 98 | 0 58 |
| 5. විලච්චිය කෝරලේ ... ... ... | 60 48 | 0 57 |
| 6. කඩවත් කෝරලේ ... ... ... | 60 31 | 0 57 |
| 7. කැඳෑ කෝරලේ ... ... ... | 60 31 | 0 58 |
| 8. උලගල්ල කෝරලේ ... ... ... | 60 40 | 0 57 |
| 9. උඩඩියන් කුලම කෝරලේ ... ... ... | 60 40 | 0 57 |
| 10. මහාපොතාන කෝරලේ ... ... ... | 60 40 | 0 58 |
| 11. කල්පේ කෝරලේ ... ... ... | 60 40 | 0 58 |
| 12. කුන්චුට්ටු කෝරලේ ... ... ... | 60 40 | 0 59 |
| 13. කැකිරාව සුළු නගර සභා සීමාවන් ... ... | 60 03 | 0 56 |
| 14. කැකිරාව සුළු නගර සභා සීමාවන් හැර කලාගම් කෝරලේ (දකුණු) | 60 03 | 0 57 |
| 15. කලාගම් කෝරලේ (උතුරු) ... ... | 60 03 | 0 57 |
| 16. මාමිනියා කෝරලේ ... ... ... | 60 03 | 0 57 |
| 17. මාටඹුවා කෝරලේ ... ... ... | 60 03 | 0 58 |
| 18. කිරලව කෝරලේ ... ... ... | 60 03 | 0 58 |
| 19. උඳුරුව කෝරලේ ... ... ... | 60 03 | 0 58 |
| 20. නෑගම් පහ කෝරලේ ... ... ... | 60 03 | 0 58 |

**සැළකිය යුතුයි.**—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමේ නියමිත මිළ නොවේ. මේ වා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි වැඩිම මිළ වේ. එකී මිළට වැඩියෙන් නොවිකිණිය යුතුයි.

අ. 51 වැනි අංකය දරණ ආහාර මිළ නියෝගය — සීනි (සුදු)

## 1950 අංක 29 දරණ මිල පාලන පනත

### නියෝගය

අනුරාධපුර දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක තැන්පත් ජෝන් ක්ලැරන්ස් ලක්ෂමන් මෙල්ඩර් ගුණරත්න වන මම 1950 අංක 29 දරණ මිළ පාලන පණතේ 3 (2) දරණ වගන්තිය සමහ කිය විය යුතු 4 වෙනි වගන්තියෙන් මට පැවරී තිබෙන බල තල අනුව—

1. 1956 මැයි 11 වෙනි දින හා 10,928 වෙනි අංකය දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරණ ලද 1956 මැයි මස 7 වෙනි දින හා අ. 10 වැනි අංක දරණ ආහාර මිළ නියෝගය අද දින සිට මෙයින් අවලංගු කරමි.

2. සුදු සීනි තොග වශයෙන් විකිණීමේදී දළ බර හොණ්ඩරයක්ද, සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක්ද, මීට යා කර ඇති උප ලේඛණයේ 1 වැනි තීරයේ සඳහන් ප්‍රදේශයන් ඇතුළත විකිණිය හැකි වැඩිම මිළ මේ දැන් පටන් මේ උප ලේඛණයේ 2 වැනි හා 3 වැනි තීරවල අනුපිළිවෙලින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

3. තවද මෙම නියෝගයේ කාර්ය සඳහා—

(අ) සීනි ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ වරකට සීනි දළ බර හොණ්ඩරයකට වැඩි ප්‍රමාණයක් බැගින් කොයි අන්දමට විකිණීම හෝ තොග වශයෙන් විකිණීමක් ලෙස සළකනු ලබන බවත්,

(ආ) සීනි පරිභොගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ දළ බර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සළකනු ලබන බවත්,

(ඇ) සීනි යන්නෙන් සියළුම හකුරු වර්ග අත්හැර සළකනු ලබන බවත්, මෙම නියෝගයෙන් නියම කරමි.

4. එසේම මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම සීනි වෙන ද්‍රව්‍යයක් සමහ මිශ්‍ර කිරිමෙන් බාලකොට කිසිවෙකු විසින් නො විකිණිය යුතු බවද නියම කරමි.

5. තවද මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ යම් වාහනයක සීනි සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ හෝ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම එම ප්‍රදේශය සඳහා මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ ගණන් සටහන් කරණ ලද දන්වීමක් එකී ස්ථානයේ හෝ වාහනයේ ප්‍රකටව පෙනෙන පරිදි තැබිය යුතු බව නියම කරමි.

6. තවද මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම සීනි තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු හා සීනි සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තකු විසින්ම මිළයට ගන්නා ඉල්ලුවහොත්, එනම් :

(අ) විකුණූ දිනය ;

(ආ) විකුණූ සීනි ප්‍රමාණය (බර අනුවයි) ;

(ඇ) විකුණූ සීනි ප්‍රමාණය සඳහා ගෙවූ මුදල සහ ;

(ඈ) වෙළඳාමේ ස්වභාවය එනම්, වෙළඳාම තොග වශයෙන්ද සිල්ලර වශයෙන්ද යන වග ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දිය යුතු බවද නියම කරමි.

7. එසේම මෙම නියෝගයේ කාර්ය සඳහා '' රාත්තල '' හෙවත් '' රා. '' යනුවෙන් සළකනු ලබන්නේ ඇවැර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නිය ම කරමි.

8. සීනි විකුණන විට එය යම් කිසි දෙයක බහා හෝ ඔතා දෙන දෙයක් වෙතොත් එහි මිළත් උප ලේඛනයේ 2 වැනි හා 3 වැනි තීරවල සඳහන් වැඩිම මිළ ගණන් වලට ඇතුළත් වන බවද නියම කරමි.

1959 මාර්තු මස 21 වෙනි දින පෙරවරු 11.30 ට අනුරාධපුරයේදී අත්සන් තබන ලදී.

ජේ. සී. ඇල්. ඇම්. ගුණරත්න,
අනුරාධපුර දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක තැන.

### උපලේඛනය

| | 1 වෙනි තීරය<br>ප්‍රදේශය | සුදු සීනි<br>2 වෙනි තීරය<br>දළ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. | සුදු සීනි<br>3 වෙනි තීරය<br>ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|---|---|
| 1. | අනුරාධපුර නගර සභා සීමාවන් හා අංක 23 සී දරන තුලාන ... | 67 24 ... | 0 63 |
| 2. | අනුරාධපුර නගර සභා සීමාවන් හැර නුවරගම් කෝරලේ ... | 67 24 ... | 0 64 |
| 3. | අංක 23 සී දරන තුලාන හැර කනදරා කෝරලේ ... | 67 24 ... | 0 64 |
| 4. | එප්පාවල කෝරලේ ... ... ... | 67 24 ... | 0 65 |
| 5. | විලච්චිය කෝරලේ ... ... ... | 67 74 ... | 0 64 |
| 6. | කඩවත් කෝරලේ ... ... ... | 67 57 ... | 0 64 |
| 7. | කැඳෑ කෝරලේ ... ... ... | 67 57 ... | 0 65 |
| 8. | උලගල්ල කෝරලේ ... ... ... | 67 66 ... | 0 64 |
| 9. | උඩ්ඩියන්කුලම කෝරලේ ... ... ... | 67 66 ... | 0 64 |
| 10. | මහ පොතාන කෝරලේ ... ... ... | 67 66 ... | 0 65 |
| 11. | කල්පේ කෝරලේ ... ... ... | 67 66 ... | 0 65 |
| 12. | කුන්චුට්ටු කෝරලේ ... ... ... | 67 66 ... | 0 66 |
| 13. | කැකිරාව සුළු නගර සභා සීමාවන් ... ... | 67 29 ... | 0 63 |
| 14. | කැකිරාව සුළු නගර සභා සීමාවන් හැර දකුණු කලාගම් කෝරලේ | 67 29 ... | 0 64 |
| 15. | උතුරු කලාගම් කෝරලේ ... ... ... | 67 29 ... | 0 64 |
| 16. | මාමිනියා කෝරලේ ... ... ... | 67 29 ... | 0 64 |
| 14. | මාටඹුවා කෝරලේ ... ... ... | 67 29 ... | 0 65 |
| 18. | කිරලව කෝරලේ ... ... ... | 67 29 ... | 0 65 |
| 19. | උඳුරුව කෝරලේ ... ... ... | 67 29 ... | 0 65 |
| 20. | නෑගම් පහ කෝරලේ ... ... ... | 67 29 ... | 0 65 |

**සැළකිය යුතුයි.**—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමේ නියමිත මිළ නොවේ. මෙවා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි වැඩිම මිළ වේ. එකී මිළට වැඩියෙන් නොවිකිණිය යුතුයි.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරණ ලදී